# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2016/04 - 2017 අප්‍රේල් මස 24 වැනි සඳුදා - 2017.04.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : අඹකෝ/3/5/3/24.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : LD/05/2006/A/149.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඹගමුව නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ අඹගමුව ගමේ පිහිටි, බ්ලැක්වෝටර් වත්ත නමැති ඉඩමේ නුවරඑළිය ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් සකස් කරන ලද 2016.09.22 දිනැති මු.පි.නු. 3076 හි කැබලි අංක 1 වශයෙන් සඳහන් හෙක්ටයාර් 0.7583 ක් පමණ වූ ඉඩම් කොටසක්:

**කැබලි අංක 1 - හිමිකම් කියන අය : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක 475, කඩුවෙල පාර, ගනේහේන, බත්තරමුල්ල; ප්‍රමාණය : හෙක්ටයාර් 0.7583**

මායිම් :
*උතුරට*: මු.පි.නු. 1559 හි කැබලි අංක 7, හි පි. 259510 සහ මාර්ගය (ප්‍රාදේශීය සභාව); *නැගෙනහිරට* : මු.පි.නු 1559 හි කැබලි අංක 9, 8 මෙම පිඹුරේ කැබලි අංක 2 සහ 3; *දකුණට* : මු.පි.නු. 1559 හි කැබලි අංක 8; *බටහිරට* : මු.පි.නු. 1559 හි කැබලි අංක 7.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 ජූනි මස 14 වැනි දින පෙ.ව. 10.00ට අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 ජූනි මස 07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

ආර්.ටී. පී. සුමනසේකර,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය.

2017 අප්‍රේල් මස 19 වැනි දින,
අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 216

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : මො/කතර/ඉ/03 අත්පත්/2015/02.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/9/2015/ඩබ්එස්/162.

කතරගම මලාපවහන ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීමට අංක 05 පොම්පාගාරය ඉදිකිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කතරගම ගමේ පිහිටි මොනරාගල මැනුම් අධිකාරි විසින් පිළියෙල කර ඇති අ.හු.පි. 25, අතිරේක අංක 129, පත්‍ර අංක 429 හි දැක්වෙන ඉඩම් කැබලි.

**කැබලි අංක 5040**
ඉඩමේ නම: වැවපහලහේන; හිමිකම් කියන අය : රුහුණු මහා කතරගම දේවාලය; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0153

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2017 ජුනි මස 19 වැනි දින පෙ.ව. 10.00 ට කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 ජුනි මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

එස්. සී. වීරකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
කතරගම.

2017 අප්‍රේල් මස 19 වැනි දින,
කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 218

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : මො/කතර/ඉ/03 අත්පත්/2015/01.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/9/2015/ඩබ් එස්/188.

කතරගම මලාපවහන ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීම සඳහා අංක 07 පොම්පාගාරය ඉදිකිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කතරගම ගමේ පිහිටි මොනරාගල මැනුම් අධිකාරි විසින් පිළියෙල කර ඇති අ.හු.පි. 25, අතිරේක අංක 130, පත්‍ර අංක 130 හි දැක්වෙන ඉඩම් කැබලි.

**කැබලි අංක 5041**
ඉඩමේ නම: වැවපහලහේන; හිමිකම් කියන අය : රුහුණු මහා කතරගම දේවාලය; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0153

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් 2017 ජුනි මස 19 වැනි දින පෙ.ව. 10.00 ට කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 ජුනි මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

එස්. සී. වීරකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
කතරගම.

2017 අප්‍රේල් මස 19 වැනි දින,
කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 217

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.